# ගෝලීය මූල්‍ය හා වෙළඳ ගැටුම් ජාමූඅ රැස්වීම අරක්ගනියි

**Global currency, trade conflicts dominate IMF meeting**

**බැරී ග්‍රේ විසිනි**

**2010 ඔක්තෝබර් 08**

මෙම සති අන්තයේ වොෂින්ටන්හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) හා ලෝක බැංකුවේ ඒකාබද්ධ අර්ධ වාර්ෂික රැස්වීම, ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවතුන් අතර මෙන්ම ආසියාවේ ද ලතින් ඇමරිකාවේ ද ඊනියා නැගීඑන ආර්ථිකයන් අතර ද වර්ධනය වන මූල්‍ය හා වෙළඳ ගැටුම් පිලිබඳ අවධානය දිනාගත් ස්ථානයක් බවට පත්විය.

ජාමූඅ විධායක අධ්‍යක්ෂ ඩොමිනික් ස්ට්‍රාවුස් ඛාන් මූල්‍ය සංග්‍රාමයන් පිලිබඳව අනතුරු අඟවමින් *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය වෙත මෙසේ පැවසීය. "ව්‍යවහාර මුදල් ප්‍රතිපත්ති අවියක් ලෙස යොදාගත හැකිය යන අදහස පැතිරෙන්නට පටන්ගෙන තිබෙන බව පැහැදිලිවම පෙනෙන්නට තිබේ. ක්‍රියාවට පරිවර්තනය කලහොත් එවන් අදහසක් ගෝලීය ආර්ථික ප්‍රතිප්‍රාප්තිය කෙරෙහි බරපතල අන්තරායක් වන්නේය."

ජාමූඅ පැහැදිලිවම වගකීම පැවරුවේ ඊනියා නැගීඑන ආර්ථිකයන්, විශේෂයෙන්ම චීනය තුල කෙරෙන ආන්ඩුවේ මැදිහත්වීම පැතිරීයාම වෙතය. මාධ්‍ය හමුවකදී කරුනු දැක්වූ නියෝජ්‍ය කලමනාකරන අධ්‍යක්ෂ ජෝන් ලිප්ස්කි කියා සිටියේ චීන රෙන්මින්බි හෙවත් යුවාන් මුදල "සැලකිය යුතු තරම් පහත් අගයකින් තබාගෙන ඇති" බවය.

එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ වැඩෙන චීන විරෝධී ආරක්ෂනවාදී මනෝභාවය, ඔක්තෝබර් 06 දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ පලවූ තීරුවක් තුල එහි ආර්ථික තීරු රචක මාටින් වුල්ෆ් විසින් කැටිකොට දක්වා තිබුනි. "චීනය සමග මූල්‍ය සංග්‍රාමයකට කාලය එලඹ ඇත් ද? එන්ට එන්ටම පිලිතුර ලෙස පෙනී යන්නේ ඔව් යන්නයි. චීන විනිමය අනුපාතික පිලිවෙතට එරෙහි ප්‍රහාරයක දේශපාලනය හා ආර්ථිකය වඩ වඩාත් ඒත්තු යමින් තිබේ. සැබවින්ම මේ අදහස බෙහෙවින් සිත් සසල කරන සුලුය. එහෙත්, මම තවදුරටත් ඊට විකල්පයක් ඇතැයි විශ්වාස නොකරමි."

ලිබරල්වාදියෙකු වන වුල්ෆ් සිය තීරුව නිමා කරන්නේ යම් හෙයකින් ක්‍රියාවට නැගුවහොත් චීනය යලිත් අර්ධ යටත්විජිත තත්වයකට පත්කිරීමට සමාන වනු ඇති යෝජනාවක් ද ඉදිරිපත් කරමිනි. "තනිකරම අපනයන කරුවෙක් බවට චීනය ඇද දමන ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාවට නැගීමෙන් චීන ජනතාවට මෙන්ම අවශේෂ ලෝකයට ද වාසි සැලසෙනු ඇත. පුරසාරම් දෙඩීමෙන් ඔබ්බට යාමට කාලය එලඹ තිබේ. පියවර හදිසි භාවයක් අත්කර ගනියි."

විශේෂයෙන්ම, උතුරු ඇමරිකාව, යුරෝපය හා ජපානය වැනි දියුනු ආර්ථිකයන්හි පවත්නා මන්දගාමී ආර්ථික වර්ධනයක පසුබිමෙහි, ආර්ථික අර්බුදය කෙරෙහි ජාත්‍යන්තර සම්බන්ධීකරනයක් සඳහා වන උත්සාහය, 1930 ගනන්වල ආර්ථික යුද්ධ සිහිගන්වන අසල්වැසියා හිඟමනට දැමීමේ විනිමය හා වෙළඳ පිලිවෙත් සඳහා දොරටු විවර කරයි.

ගෝලීය මූල්‍ය පද්ධතියම හා ඒ මත ගොඩනඟාගත් ආර්ථික සම්බන්ධතා සමස්ත ජාලයම, ධනේශ්වර ක්‍රමයේ පද්ධතිමය අර්බුදයක් බව පැහැදිලිවම සනාථ වී තිබෙන වියවුලෙහි බරින් බිඳ වැටෙමින් තිබේ. 2008 සැප්තැම්බරයේ ලේමන් බ්‍රදර්ස් බැංකුව බිඳ වැටීමෙන් පසුව, බැංකු හා ජාත්‍යන්තර මූල්‍ය ප්‍රභූව අත ගොඩගැසී තිබුනු බොල් නය කන්දරාවෙන් ඔවුන් බේරාගැනීමට ලෝකය පුරා ආන්ඩු විසින් ගන්නා ලද විවිධාකාර පියවරයන්, අර්බුදය පතුලේ ඇති ගැටලු විසඳීමට සමත්වූයේ නැත. ඒ වෙනුවට ඒවා මගින් ලෝක ධනවාදයේ ප්‍රතිවිරෝධයන් හා ජාතීන් අතර ආතතීන් උත්සන්න කර හා ඒ සමාජයන් තුලම අර්බුද ගැඹුරු කර තිබේ.

සිය ප්‍රධාන ආර්ථික හා භූ දේශපාලනික පිලිමලුන්ට, වඩාත් සමීපව හා ප්‍රමුඛව චීනයට එරෙහිව සිය ජාතික අවශ්‍යතා මුල්බැස්සවීම සඳහා එක්සත් ජනපදය, වෝල් වීදිය මැදිකරගෙන හටගත් අර්බුදය, වැරෙන් ගසාකනු ලබයි.

ඔබාමා පාලනාධිකාරය, ජාමූඅ සාමාජික රටවල් 187 මුදල් ඇමතිවරු හා මහ බැංකුකරුවන් සහභාගී වන මේ සති අන්තයට යෙදී ඇති මූල්‍ය අරමුදලේ රැස්වීම තුලින්, රෙන්මින්බි මුදලේ අගය වේගයෙන් හා තියුනු ලෙස ඉහල නැංවීමට චීනයට බලපෑම් කිරීම

සඳහා වන සිය ව්‍යායාමය පිටුපස යුරෝපය, ජපානය හා අනෙකුත් ආසියානු රටවල් පෙල ගස්වා ගැනීමේ වෑයමක නිරතව සිටියි.

ඔබාමා පරිපාලනයේ නිලධාරීන්, දැඩි චීන විරෝධී මෙන්ම ඩොලරයට සාපේක්ෂව තමන්ගේ ව්‍යවහාර මුදල්වල අගය ඉහල නැංවිය යුතු යයි එක්සත් ජනපදය දරන මතයට ප්‍රතිරෝධය දක්වන, ජර්මනිය හා ජපානය වැනි වෙළඳ හා සංචිත අතිරික්තයන් සහිත අනෙකුත් රටවලට එරෙහිව ද දැඩි ආස්ථානයක් ගන්නා ලෙස මේ සතිය තුල ජාමූඅ බලපෑම් කලේය, එක්සත් ජනපදය, සිය අපනයනයන්ගේ සාපේක්ෂ මිල ගනන් පහතහෙලා ගැනීමේ හා සිය ප්‍රතිවාදීන්ට එරෙහිව තරගකාරී වාසියක් අත්කර ගැනීමේ ලාභ ඩොලර් ප්‍රතිපත්තියක් අනුගමනය කරයි.

එක්සත් ජනපදය හා අනෙකුත් ගෙවුම් ශේෂ හිඟයන් සහිත රටවල් සිය අපනයන වර්ධනය කරගන්නා අතර චීනය ජපානය, ජර්මනිය හා අනෙකුත් නිර්යාත මාධ්‍ය කරගත් රටවල් ඔවුන්ගේ අතිරික්තය පහත හෙලිය යුතු බව කියා සිටිමින් ලෝක ආර්ථිකය ප්‍රති තුලනය කිරීමේ අවශ්‍යතාවක් අවධාරනය කරන එක්සත් ජනපද පිලිවෙත පොදුවේ අනුගමනය කල ජාමූඅ ලෝක ආර්ථික දැක්ම හා එහි ගෝලීය ස්ථායිකරන වාර්තාව මේ සතියේ එලිදැක්වීය. එහෙත්, ජාමූඅ ලොකුම කොටස්කරුවා ද ආධාරකරුවා ද වීම නිසා පමනක් අරමුදල මත අධිකාරය පවත්වන එක්සත් ජනපදයට, තම පිලිවෙත් සංවිධානය විසින් වඩාත් ආක්‍රමනශීලී ලෙස අනුගමනය කිරීම අවශ්‍යවී ඇත.

කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය හා වෙළඳපොලවල් එකතැන පල්වෙන තත්වය හමුවේ සෑම රටක්ම සටන් වදින්නේ නිර්යාත වෙළඳපොලෙහි තම පංගුව වැඩිකර ගැනීමටය. *ෆිනෑන්ෂල් ටයිම්ස්* විචාරක ජෝන් ප්ලෙන්ඩර් 05දා පලකල ලිපියක මෙසේ ලිවීයඃ "1930 ගනන්වලදී සිදුවූ පරිදි සෑම කෙනෙක්ම සිය ගැලවීමේ මාවත ලෙස දකින්නේ අපනයන වැඩිකර ගැනීමය. එහෙත් අර්ථ කථනයට අනුව එය කල නොහැක්කකි. එබැවින් ආරක්ෂනවාදයේ අන්තරාය ද සමඟින් ගෝලීය අසමතුලිතයන් යලි නැඟ ඒමට පටන් ගෙන තිබේ."

මේ සතියේ සිදුවීම් මාලාවක්ම, පුලුල් ලෙස ගෙනහැර දක්වන මූල්‍ය සංග්‍රාමයක් ඇවිලයාම පිලිබඳ සලකුනු විදහා දක්වයි. 04දා බ්‍රසීලය සිය බැඳුම්කර මිලට ගන්නා විදේශිකයන්ට පිරිනමා තිබුනු බදු සහනදායක බද්ද දෙගුන කලේය. මෙසේ කරන ලද්දේ, 2009 වසර ආරම්භයේ පටන් බ්‍රසීල ව්‍යවහාර රියාල් මුදල, ඩොලරයට සමානුපාතිකව සියයට 39න් ඉහල නැංවූ, රට තුලට ගලාඑන සමපේක්ෂන ප්‍රාග්ධනයට වැට බැඳීම සඳහා ය.

බ්‍රසීලය, ඉන්දියාව, තායිලන්තය, දකුනු කොරියාව හා තායිවානය ද ඇතුලු නැඟී එන ආර්ථිකයන් අතරින් එකකි. මෙම රටවල මුදල, පොලී අනුපාතික බිංදුවට ආසන්න අගයක කැරකෙන දියුනු රටවලදී ලබාගත හැකිවාට වඩා ඉහල ප්‍රතිලාභ සොයාගෙන ඇදී ආ ප්‍රාග්ධනය හේතුකොටගෙන තියුනු ලෙස අධිප්‍රමානය වී තිබේ. මෙම බොහෝ රටවල්, සිය මුදලේ අගය සමබරව තබාගැනීම සඳහා නිතර නිතරම මූල්‍ය වෙළඳපොලට මැදිහත් වෙයි.

ඔක්තෝබර් 05දා ජපාන මහ බැංකුව, තම පාදක පොලී අනුපාතය සියයට 0.0-0.1 අතර මට්ටමට පහත හෙලන බවත්, ජපාන රජයේ බැඳුම්කර හා අනෙකුත් සුරැකුම් මිලට ගැනීම සඳහා ඩොලර් බිලියන 60 ක වැඩසටහනක් දියත් කිරීමට සැලසුම්කර ඇති බවත් නිවේදනය කලේය. මෙම ඊනියා "ප්‍රමානාත්මක ලිහිල් කිරීමේ" ප්‍රතිපත්තිය, යෙන් මුදල් අච්චුගැසීමට සමාන වේ.

ඩොලරයට සාපේක්ෂව මෙම වසර තුල සියයට 13න් අධිප්‍රමානයවූ යෙන් මුදලේ හුවමාරු අනුපාතිකය, ජපාන අපනයන වඩාත් ලාභ කිරීමේ අරමුනෙන් පහත දමාගැනීමේ උත්සාහයකට එරට මුලපුරා තිබේ. සැප්තැම්බර් 15දා ජපාන ආන්ඩුව, වසර හයකට පසුව එම කාරනය සඳහා ම ඒකපාර්ශවිකව යෙන් ට්‍රිලියන දෙකක් විකුනා දැමීය.

පසුගිය මාර්තුවේදී අවසන් කල ප්‍රමානාත්මක ලිහිල් කිරීමේ පිලිවෙත, එක්සත් ජනපදයේ මහ බැංකුව විසින් යලි පනගන්වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 05දා ජපානය ගත්තේ එය පූර්වභංග කරන පියවරකි. එක්සත් ජනපදයේ උද්ධමන අනුපාතය ඉතා පහල අගයක පවතින බව පෙන්වා දෙමින් මහ බැංකුව භාන්ඩාගාර බිල්පත් මිලට ගැනීම යලි ඇරඹිය යුතු බව කියාසිටින ප්‍රසිද්ධ ප්‍රකාශ මහ බැංකුවේ ප්‍රමුඛ නිලධරයින් විසින් පසුගිය සතිය පුරාම නිකුත්කරන්ට යෙදුනි. මේවා ද මහ බැංකු අධිපති බෙන් බර්නාන්කේ විසින් කරන ලද ඒ හා සමාන ඇඟවීම් වලින් ද අදහස් කෙරෙන්නේ, මූල්‍ය වෙළඳපොලෙහි ග්‍රීන්බැක් හෙවත් ඩොලරයේ හුවමාරු අනුපාතිකය තවදුරටත් පහත හෙලීම පිනිස ඩොලර් විකිනීම දිරිගැන්වීමයි.

එවන් පියවර, මුදල් අවප්‍රමානයේ තරගකාරී පිලිවෙතක් හා වොෂින්ටනයේ ප්‍රධාන වෙළඳ තරගකරුවන් වෙතින් එල්ල වන නොවැලැක්විය හැකි සමාන ප්‍රතිචාර අවුලුවාලීමට පමනක් සමත් වෙයි. එදින ම බ්‍රසල්ස්හි පැවැත්වෙන යුරෝපීය-ආසියානු ආර්ථික සමුලුවේදී යුරෝ කලාපීය මුදල් ඇමතිවරු චීන අග්‍රාමාත්‍ය වෙන් ජියාබාවෝ මුනගැසී යුරෝ මුදලට සාපේක්ෂව රෙන්මින්බි අගය වැඩිකිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන ලෙස ඉල්ලා සිටියහ. වෙන්

දෙපාර්ශවය අතර පොරයට ඉඩ සලසමින් ඔවුන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කලේය. පසු දිනයේ බ්‍රසල්ස්හිදි පැවති ව්‍යාපාරික හමුවක පෙනී සිටිමින් චීන අගමැති, රෙන්මින්බි අගය ද්විඅංකන වේගයෙන් ඉහල නැංවීම සඳහා කෙරෙන එක්සත් ජනපද හා යුරෝපීය ඉල්ලීම්වල ප්‍රතිවිපාක පිලිබඳව අනතුරු ඇඟවීය. "සමහර පුද්ගලයින් ඉල්ලන පරිදි අප, යුවාන් මුදලේ අගය සියයට 20න් නැතිනම් සියයට 40න් ඉහල නැංවුවහොත් අපගේ බොහෝ කම්හල් වැසීයා හැකි අතර සමාජය කැලඹීමට පත්වනු ඇත." වෙන් පැවසීය.

"අපගේ බොහෝ අපනයන කර්මාන්ත සමාගම් වසා දැමීමට සිදුවන අතර සංක්‍රමනික කම්කරුවන්ට ඔවුන්ගේ ගම්බිම් බලා ආපසු යාමට සිදුවනු ඇත. චීනය ආර්ථික ව්‍යසනයකට මුහුනපෑවොත් එය ලෝකයට ද විනාශයක් වනු ඇත." වෙන් තව දුරටත් පැවසීය.

එදින ම සවස් යාමයේ එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් ගේත්නර්, වාරනය කිරීම සඳහා චීනය නම්කරන ලෙස මූල්‍ය අරමුදලෙන් ඉල්ලමින් ප්‍රකෝපකාරී කථාවක් පැවැත්වීය. වොෂින්ටනයේ ඇති ඩිමොක්‍රටික් නැඹුරුවක් සහිත බෲකිංන්ග්ස් බුද්ධි ආයතනයේදී කථා කරමින් ගේත්නර් නොවරදින ලෙසම චීනය වෙත ඇඟිල්ල දිගු කල අතර, "පහත අගයකින් යුත් විනිමය අනුපාතිකයන් සහිත විශාල ආර්ථිකයන් මුදල අධිප්‍රමානය නොකර පවත්වා ගන්නා කල, එයම කිරීම සඳහා අනෙකුත් රටවල් ද පොලඹවයි." ජාතීන් තම මුදල පහත අගයක තබාගැනීමට තරග කරන විට "මෙය භයානක ගතිකයක් මුදාහරියි."

පීඩාවට පත් පාර්ශවයක් ලෙස පෙනී සිටීමට උත්සාහ කරමින් ඔහු ප්‍රකාශ කලේ, අවපාතය ඇවිලවූ 1930 ගනන්වල තරගකාරී අවප්‍රමානයන් වෙනුවට ලෝකය, දැන් මුහුන දී සිටින්නේ "ප්‍රති අධිප්‍රමානයේ තරගයකටය." මෙම විදග්ධ සූත්‍රය, වොෂින්ටනයේ ලාභ ඩොලර් ප්‍රතිපත්තිය නිදොස් කරන පරිදි තමන්ගේ මුදල අධිප්‍රමානය වීමට ඉඩහරින ලෙසට කෙරෙන එක්සත් ජනපදයේ බලපෑමට ප්‍රතිරෝධය දක්වන චීනය වැනි - ජර්මනිය හා ජපානය ද ගම්‍ය වන - අතිරික්තයක් සහිත රටවල් මත මුලුමනින්ම මූල්‍ය යුද්ධයේ චෝදනාව පැටවීමකි.

එන්ට එන්ටම ආරක්ෂනවාදී දිසාවට යොමුවන එක්සත් ජනපදයේ ප්‍රතිපත්තිය. තම මුදල පහත අගයක පවත්වාගන්නේ යයි සලකන රටවල් මත අලාභ පැනවීමේ දඬුවම් නියම කිරීමට වානිජ්‍ය දෙපාර්තමේන්තුවට ඉඩ සලසන පරිදි චීනයට එරෙහිව විවෘතව එල්ල කල පනතක්, පසුගිය මාසයේදී නියෝජිත මන්ත්‍රී මන්ඩලය විසින් සම්මත කල අවස්ථාවේදී එලිබැස්සේය.

සිය තරගකරුවන්ගේ මුදල් දූෂ්භාවිතය පිලිබඳ එක්සත් ජනපදයේ පැමිනිලි මධ්‍යයේ ඩොලරය, මේ සතිය තුල අනෙකුත් ප්‍රධාන මුදල් වලට සාපේක්ෂව මාස අට හමාරකට පසුව වාර්තාවූ පහලම මට්ටමට ලඟා විය. යෙන් මුදලට සාපේක්ෂව එය 15 වසරකට පසු පහතම මට්ටම විය.

ලෝක මූල්‍ය පද්ධතියේ පොදු අර්බුදය, රත්රන් මිලෙහි පුපුරන සුලු වර්ධනය තුල තියුනු ප්‍රකාශනය අත්කර ගත්තේය. ඔක්තෝබර් නිකුතුව සඳහා වන කොමෙක්ස් රත්රන් ට්‍රෝයි අවුන්සයක් 04දා ඩොලර් 23.50න් ඉහල නැඟී, ඩොලර් 1338.90 නව වාර්තාගත මට්ටමකට ලඟාවිය. මේ අතර, තම ගෝලීය මූල්‍ය ස්ථාවරත්වය හා ලෝක ආර්ථික දැක්ම යන වාර්තා දෙකෙහිම ජාමූඅ, එලඹෙන වර්ෂයේ ආර්ථික තත්වය හා බලාපොරොත්තු පිලිබඳව දක්වා ඇත්තේ අඳුරු සිතුවමකි. සියල්ල හමුවේ ජාමූඅ අනාවැකි පලකලේ මේ වසරේ ආර්ථිකය සියයට 4.8න් ප්‍රසාරනය වන බවට හා ලබන වසරේ වර්ධනය සියයට 4.2 දක්වා හැකිලෙන බවටත්ය.

2010 එක්සත් ජනපදයේ වර්ධනය පිලිබඳව සංවිධානය පසුගිය ජූලි මාසයේ කල පුරෝකථනය සියයට 3.3 සිට 2.6 දක්වා පහත හෙලීය. 2011 සඳහා එක්සත් ජනපද ආර්ථිකය මුලින් සඳහන් කල සියයට 3 සිට සියයට 2.3 කින් සුලු වශයෙන් ප්‍රසාරනය වනු ඇතැයි එය බලාපොරොත්තු වෙයි.

යුරෝ කලාපය හා ජපානය සඳහා වන ප්‍රක්ෂේපන ඊටත් වඩා නරකය. යුරෝපයේ වර්ධනය මේ වසරේ සියයට 1.7 ද 2011 සියයට 1.5 ද වශයෙනි. ජපානයේ වර්ධනය මේ වසරේ සියයට 2.8 ද එලඹෙන වසරේදී තියුනු වැටීමක් සමඟ සියයට 1.5 ක් ලෙස ද ගනන් බලා තිබේ.

දියුනු රටවල ආර්ථිකයන් ඒකාබද්ධව ගත් කල මේ වසරේ සියයට 2.7 ද ලබන වසරේ 2.2 ද වශයෙන් ප්‍රසාරනය වනු ඇත. මේ වසරේ සියයට 7.1 ද ලබන වසරේ සියයට 6.4 ද වශයෙන් සංවර්ධනය වන හා නැඟීඑන රටවල ආර්ථිකයන්හි සාපේක්ෂ ඉහල ප්‍රසාරනය, සමස්ත ගෝලීය වර්ධනය පිලිබඳ සංඛ්‍යා දත්ත සඳහා බෙහෙවින් දායක වී තිබේ.

"ප්‍රතිපලය, ශක්තිමත් හෝ සමතුලිත නොවන අතර තිරසාර නොවීමේ අවදානම ද දරා සිටියි." ජාමූඅ ලෝක ආර්ථික දැක්මට කල හැඳින්වීම තුල ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ඔලිවර් බ්ලැන්චාර්ඩ් එසේ ලිවීය. ලෝකය පුරා 2007 වසරේ පටන් මිලියන 30න් වර්ධනය වී ඇති, මිලියන 210 තරම් වන මිනිසුන් නිල වශයෙන් රැකියා වියුක්තිකයන් ලෙසට ගනන් බලා ඇති බව 05 දින පැවති මාධ්‍ය හමුවකදී බ්ලැන්චාර්ඩ් පැවසීය.

"විරැකියා අනුපාතය ඉතා ඉහල අගයක දිගටම පවතිනු ඇත." එක්සත් ජනපදයේදී එය සියයට 9.6 ක මට්ටමේ ද යුරෝ කලාපයේ සියයට 10 මට්ටමේ ද පවතිනු ඇත.

ඒ සමග ම, ගෝලීය මූල්‍ය ස්ථාවරත්වය පිලිබඳ වාර්තාවට අනුව, ලෝක මූල්‍ය පද්ධතිය බෙහෙවින් අඩමාන තත්වයක පවතින අතර තවත් බිඳ වැටීමක් සිදුවීමේ ඉඩකඩ බෙහෙවින් වැඩිය. "ගෝලීය මූල්‍ය ක්‍රමය තවමත් ඇත්තේ සැලකිය යුතු අවිනිශ්චිත තත්වයක වන අතර ආර්ථික ප්‍රතිප්‍රාප්තිය සඳහා එය බරවා කකුලක් බවට පත්ව තිබේ. යුරෝපයේ මෑතකදී ඇතිවූ රාජ්‍ය නය වෙලඳපොලවල අර්බුදය තුලින් නැඟීඑන බැංකුවල හා රාජ්‍ය ශේෂපත්‍රවල උග්‍ර වන රෝගී තත්වය වඩාත් ඉස්මතු කර තිබේ." වාර්තාව තව දුරටත් සඳහන් කරයි.

ඉදිරි වසර තුල ඩොලර් ට්‍රිලියන 4 ක බැංකු නය ප්‍රමානයක් අවිනිශ්චිත වනු ඇතැයි වාර්තාව සඳහන් කරයි.

ජාමූඅ ගෙනහැර දක්වා ඇති සියලු ප්‍රතිකර්මයන්හි පොදු ලක්ෂනය වන්නේ කම්කරු පන්තිය මත රුදුරු ප්‍රහාරයකි. "දියුනු රටවලදී, 2011 ආරම්භයේ පටන්ම ඇරඹීම අවශ්‍ය වන මූල්‍ය ඒකාබද්ධතාවය" සංවිධානය විසින් ඉල්ලා සිටියි.

ලෝක ආර්ථික දැක්ම පැහැදිලිව ම පෙන්වාදී ඇත්තේ, එවන් සීරුමාරු කිරීම් ව්‍යාපාරික ප්‍රභුව නොව කම්කරු පන්තියේ ජීවන තත්වයන් ඉලක්ක කරගත යුතු බවයි. "එවන් සැලසුම්, වේගයෙන් වර්ධනය වන වියදම් වැඩ සටහන් පිලිබඳ සංශෝධන ඇතුලත් කරගත යුතු අතර ප්‍රධානකොට ම සමාජ සහන වැඩ සටහන් හා පරිභෝජනයට වඩා නිෂ්පාදනයට දායක වන බදු සංශෝධන සිදුවිය යුතුය."

නැඟීඑන ආර්ථිකයන් සඳහා ජාමූඅ ප්‍රතිකර්ම වට්ටෝරුව, මුදලේ අධිප්‍රමානය හා තොග පිටින් රැකියාවලින් දොට්ට දැමීම හා ජනගහනයේ පුලුල් කොටස් දරිද්‍රතාවයට ඇද දැමීම පමනක් අර්ථවත් වන අපනයන කපාහැරීම් අඩංගු කර ගනියි.

© www.wsws.org